# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1977/5 - 2016 ජූලි මස 25 වැනි සඳුදා - 2016.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 14/2014

**පඩි පාලක සභා ආඥා පනත**

(136 වැනි අධිකාරය වූ) පඩි පාලක සභා ආඥා පනතේ 63 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදනු ලබන පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝගය.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

2005 මාර්තු මස 4 වැනි දින අංක 1382/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝගය මගින් අවසන් වරට සංශෝධිත සහ 1971 ජුනි මස 4 වැනි දින අංක 14961 දරන ලංකා *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1971 පඩි පාලක සභා නියෝගවල 31 වැනි නියෝගය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :-

1. ඒ නියෝගයේ (අ) අනුඡේදයේ ''රුපියල් හාරසියයක්'' යන වචන වෙනුවට ''රුපියල් එක් දහස් පන්සියයක්'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

2. ඒ නියෝගයේ (ආ) අනුඡේදයේ ''රුපියල් පන් සියයක්'' යන වචන වෙනුවට රුපියල් දෙදහසක් යන වචන ආදේශ කිරීමෙන්.

08 - 187

1A - G 23904 — 57 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*